**ශීර්ෂය 331 – දිවි නැගුමසංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය, දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදි. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 331- දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 11 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.17 දක්වා ඡේදවල සඳහන් කර ඇත.

මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබූ බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරි එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
| --- | --- | --- | --- |
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ නියමිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම අනුගමනය නොකිරීම.<br>2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලසුම් නොකිරීම.<br>3. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම. | 2.1<br>2.2.1<br>2.10 (අ)(ආ) |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | 1. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම.<br>2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු<br>3. මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ අඩුපාඩු | 2.1.2(අ) (ආ)<br>2.2.2<br>2.9 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.<br>2. අනුකූල නොවීම. | 2.7 (අ)(ආ) හා (ඇ)<br>2.16 |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | | |
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරිත්වය කලින් කල සෝදිසි කරන බව. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.11 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බවටත්, ඒවා වරින් වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත් ඒවා නිසියාකාරව නිෂ්කාශනය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශනය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | 1. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් කිරීමේ අඩුපාඩු.<br>2. වත්කම් කළමනාකරණයේ අඩුපාඩු. | 2.3 (එ)<br>2.3 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව. | අවිධිමත් ගනුදෙනු. | 2.5 |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැදී සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත ඉදිරිපත් කරනු ලබන බව. (මුදල් රෙගුලාසි 150) | විසර්ජන ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.10 |
| 128(1)(ග) | ඇප තැබීමට බැදී සිටින නිලධාරීන් එවකට වලංගු නීතිය හා නියමයන් අනුව ඇප තබන බව. | අදාළ නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමේ අඩුපාඩු. | 2.7 (ආ) |
| 128(1)(ජ) | නිලධාරීන්ගේ /සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 | 1. නිවැරදි ඇස්තමේන්තුවලින් තොරව වත්කම් අපහරණය කිරීම. | 2.3(ඉ) |

| | | |
|---|---|---|
| සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව . | 2. වත්කම්වලින් රජයට ලැබිය යුතු ආදායම් නොලැබීම. | 2.3(ඇ) |
| | 3. පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම. | 2.3 (අ) (ආ)හා (ඇ) |
| | 4. මූල්‍ය අක්‍රමිකතා ස්වභාවයේ ගනුදෙනු. | 2.7 (එ) හා (ක) |
| | 5. පාඩු හා හානි. | 2.6 |
| | 6. හානි පිළිබඳ වගකීම. | 2.6 |

## 1.5 දෙපාර්තමේන්තුවේ අරමුණු හා ප්‍රධාන කාර්යයන්

(අ) දිළිඳුබව තුරන් කිරීම සහ සමාජ සාධාරණත්වය සහතික කරනු ලබන සමාජයක් බිහි කිරීම සඳහා අවශ්‍ය විය හැකි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම;

(ආ) පුද්ගල, පවුල, කණ්ඩායම් සහ ප්‍රජාව කේන්ද්‍ර කරගත් ජීවනෝපාය ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම;

(ඇ) එක් එක් පුද්ගලයා සහ පවුල වෙනුවෙන් ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම;

(ඈ) ජාතික සංවර්ධනය වේගවත් කිරීම සඳහා ජනතාව ඒකරාශි කිරීම හා සවිබල ගැන්වීම;

(ඉ) ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය ඉහළ නැංවීමේ කාර්ය සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සැපයීම;

(ඊ) ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා අවශ්‍ය විය හැකි භෞතික හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම;

(උ) ජනතාවගේ ආර්ථික සහ සමාජ සංවර්ධනයට අවශ්‍ය විය හැකි අධ්‍යයන සහ පර්යේෂණ කටයුතු සිදු කිරීම;

(ඌ) ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම; සහ

(එ) සමාජ ආරක්ෂණයක් අවශ්‍ය පුද්ගලයන් සඳහා සමාජ ආරක්ෂණ ජාලයක් නිර්මාණය කිරීම.

## 1.6 දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන හා එමගින් ඉටුකළ යුතු කාර්යභාර්යය

දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කර ඇති ආයතන හා ඒවායේ කාර්යභාරය පහත දැක් වේ.

| | **දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන** | **ස්ථාපිත කිරීමේ බලය** | **කාර්යභාරය** |
|---|---|---|---|
| i. | ප්‍රජාමූල බැංකු අංශය | 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ 25 වන වගන්තිය | ක්ෂුද්‍ර මූල්‍ය බැංකු කටයුතු, දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ ඉතුරුම් පුරුද්ද වැඩි දියුණු කිරීම හා ප්‍රජාමූල බැංකු පද්ධතිය මෙහෙය වීම හා අධීක්ෂණය කිරීම. |

| | | | |
|---|---|---|---|
| ii. | ප්‍රජාමූල බැංකු 1,074 ක් | එම | ප්‍රතිලාභීන් අතර මූල්‍ය කළමනාකරණය හා බැංකු සංස්කෘතිය වර්ධනය කරමින් ඔවුන් ඉතිරි කිරීම් සඳහා උනන්දු කිරීම, සාමාජික ගිණුම් පවත්වාගෙන යාම, ණය ලබා දීම හා රජයේ සහනාධාර බෙදාහැරීම. |
| iii. | ප්‍රජාමූල බැංකු සමිති 331ක් | 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ 29 වන වගන්තිය | ප්‍රජාමූල බැංකුවලින් තැන්පතු එකතුකර ඒවා කළමනාකරණය කිරීම, ප්‍රතිලාභීන් අතර ක්ෂුද්‍ර මූල්‍ය සංස්කෘතිය වැඩි දියුණු කිරීම සඳහා පියවර ගැනීම සහ ප්‍රජාමූල බැංකු කටයුතු මෙහෙයවීමේ ප්‍රාදේශීය ආයතනයක් ලෙස ක්‍රියා කිරීම. |
| iv. | දිවි නැගුම සමාජ ආරක්ෂණ අරමුදල | 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ 45 වන වගන්තිය | ප්‍රතිලාභීන්ගේ දායක මුදල් ලබා ගනිමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය බැරෑරුම් ලෙස කඩා වැටුණු විටදී ඒ සඳහා සහන සැලසීම හා දිළිඳු අයගේ සමස්ථ ආර්ථික, සමාජ තත්ත්වය වැඩි දියුණු කරමින් ඔවුන් පෝෂණය කිරීම. |
| v. | නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල | එම | ප්‍රතිලාභීන්ගේ දායක මුදල් ලබා ගනිමින් ප්‍රතිලාභී පවුල්වල සුභසාධනය වැඩිකිරීම සඳහා තාවකාලික නිවාස ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලබාදීම පිණිස නිවාස ලොතරැයි ක්‍රමය ක්‍රියාත්මක කිරීම. |
| vi. | බැංකු ලිපිද්‍රව්‍ය චක්‍රිය අරමුදල | එම | මුළු දිවයිනේම බැංකු ලිපිද්‍රව්‍ය ඒකීය තත්ත්වයක් ඇති කර ගනිමින් දිවි නැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති භාවිතා කරන ලිපිද්‍රව්‍ය සහනදායි මිලකට මධ්‍යගතව මුද්‍රණය කර බෙදාහැරීම. |
| vii. | දිවි නැගුම අරමුදල | එම | ආදායම් උත්පාදන ක්‍රමවේදයන් හඳුන්වා දී දිළිඳු ජනතාව ස්වයං රැකියා සඳහා යොමුකර තිරසාර ලෙස සවිබල ගැන්වීම. |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

#### 2.1.1 සැලැසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ඉටුකළ යුතු ප්‍රධාන කාර්යයන් 39 ක් පැවති අතර, එම ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ක්‍රියාකාරී සැලැස්මෙන් ප්‍රතිපාදිත රු. මිලියන 1,200 ක මුදලෙන් ජුනි 30 දිනට දිස්ත්‍රික් කාර්යාල වෙත නිදහස් කළ මුදල සියයට 15 ක් වූ රු. මිලියන 183.99 ක් ද, උපයෝජනය කළ මුදල රු. මිලියන 124.85 ක් ද වූ නමුත් වර්ෂය අවසන් වන විට සියයට 95.7 ක් හෙවත් රු. මිලියන 1,148.70 ක් වැය කර තිබීමෙන් සැලසුම්ගත නොවූ ආකාරයට වර්ෂය

අවසානයේ මුදල් වැයකර ක්‍රියාකාරී සැලැස්ම දෙසැම්බර් 28 දින දෙවන වරට සංශෝධනය කර තිබුණි.

(ආ) ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ දිවයින පුරා සංවර්ධනය කළ යුතු යටිතල පහසුකම් හඳුනාගෙන නොතිබූ අතර රු. මිලියන 99.25 ක ප්‍රතිපාදිත මුදලින් රු.මිලියන 97.18 ක් දිස්ත්‍රික්ක 7 ක යටිතල පහසුකම් සඳහා පමණක් වැය කර තිබුණි.

**2.1.2 කාර්යයන් ඉටු නොකිරීම**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කාර්යයන් ඉටු නොකිරීම

-------------------------------------------------------------

ක්‍රියාකාරි සැලැස්ම අනුව එකතුව රු. මිලියන 25 ක ප්‍රතිපාදන මත ඉටුකිරීමට සැළසුම් කළ පහත සඳහන් ප්‍රධාන කාර්යයන් 4 ක් ඉටුකිරීමට කටයුතු නොකර එම ප්‍රතිපාදනය වර්ෂය අවසානයේ පරිගණක මිලදී ගැනීම සඳහා යොදාගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| | ප්‍රධාන කාර්යය | සලසා තිබුණු ප්‍රතිපාදනය |
|---|---|---|
| | ----------------- | ---------- |
| | | රු.මිලියන |
| (i) | මෘදුකාංග හා දෘඩාංග පද්ධති ස්ථාපිත කිරීම, VPN පහසුකම් සම්බන්ධ කිරීම හා වෙබ්සයිට් එකක් හඳුන්වා දීම යන කාර්යයන් යටතේ සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,074 ක් පරිගණකගත කිරීමේ වැඩසටහන | 5.00 |
| (ii) | e සමෘද්ධි වැඩසටහනේ මානව සම්පත් කළමනාකරණ මොඩියුලය වැඩි දියුණු කිරීම්. | 5.00 |
| (iii) | e සමෘද්ධි වැඩසටහනේ ව්‍යාපෘති හා වැඩසටහන් කළමනාකරණ මොඩියුලය වැඩි දියුණු කිරීම. | 5.00 |
| (iv) | සමෘද්ධි ප්‍රජාමූල බැංකු නිලධාරින් හා අනෙකුත් සියළුම නිලධාරින්ට පරිගණක සම්බන්ධ පුහුණුවීම් ලබා දීම. | 10.00 |
| | | --------- |
| | එකතුව | 25.00 |
| | | ===== |

(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

-------------------------------------------------

සමාලෝචිත වාර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම මඟින් දක්වා තිබුණු වැඩසටහන් 3 ක් යටතේ ව්‍යාපෘති 3,832 ක් වෙනුවෙන් රු. මිලියන 115.33 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට එයින් ව්‍යාපෘති 1,468 ක් ක්‍රියාත්මක කර නොතිබූ අතර සලසා තිබූ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 52.57 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වැඩසටහන | කාර්යයන් සංඛ්‍යාව | සලසා තිබුණු ප්‍රතිපාදනය | සැලසුම් කළ ව්‍යාපෘති සංඛ්‍යාව | වැය නොවූ මුදල | ඉටු නොකළ ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | | රු. මිලියන | |
| (i) සමාජ සවිබල ගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩ සටහන. | 05 | 99.7 | 3,657 | 46.56 | 1,354 |
| (ii) අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන. | 01 | 0.63 | 25 | 0.14 | 02 |
| (iii) සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන. | 01 | 15.0 | 150 | 5.87 | 112 |
| | **07** | **115.33** | **3,832** | **52.57** | **1,468** |

(ඇ) **අපේක්ෂිත ප්‍රතිපාදනය ඉක්මවා වියදම් දැරීම**

වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් වැඩසටහන් 05 ක ක්‍රියාකාරකම් 09 ක් සඳහා ප්‍රතිපාදිත මුදල රු. මිලියන 299.1 ක් විය. එම ප්‍රමාණය රු. මිලියන 63.741 කින් ඉක්මවා රු. මිලියන 362.841 ක් වැයකර තිබුණි. එම ඉක්මවීම වෙනත් වැඩසටහන් සඳහා වෙන්කළ මුදල්වලින් හා බැංකු ප්‍රවර්ධන අරමුදලින් පියවා ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වැඩසටහන | ක්‍රියාකාරකම් සංඛ්‍යාව | සැළසුම් කළ ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදනය | වියදම | ඉටුකළ ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන ඉක්මවා වැය කිරීම. |
|---|---|---|---|---|---|---|
| | | | රු.මිලියන | රු.මිලියන | | රු. මිලියන |
| (i) මාධ්‍ය වැඩසටහන | 04 | 63 | 9.30 | 16.371 | 03 | 7.071 |
| (ii) සමෘද්ධි අරුනළු කුඩා හා මධ්‍යම පරිමාන ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන | 02 | හඳුනාගෙන නැත. | 145.00 | 164.850 | හඳුනාගෙන නැත. | 19.85 |
| (iii) සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහන | 01 | හඳුනාගෙන නැත. | 18.60 | 43.600 | හඳුනාගෙන නැත. | 25.00 |
| (iv) විශේෂ ව්‍යාපෘති වැඩසටහන | 01 | හඳුනාගෙන නැත. | 2.70 | 8.970 | හඳුනාගෙන නැත. | 6.27 |
| (v) සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන | 01 | හඳුනාගෙන නැත. | 123.50 | 129.050 | හඳුනාගෙන නැත. | 5.55 |
| | **09** | | **299.1** | **362.841** | | **63.741** |

(ඇ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් වැඩසටහන් 03 කට අයත් ක්‍රියාකාරකම් 14 ක මූලා ප්‍රගතිය පිළිබඳ වාර්තා සමහ වැඩසටහන් ක්‍රියාත්මක කරන අංශයන් විසින් පවත්වා තිබූ ලේඛන සසදා බැලීමේදී රු. මිලියන 17.11 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) විමර්ශන කටයුතු

--------------------

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අතින් සිදුවන වැරදි, වංචා හා සාපරාදි වැරදි ඉහළ යමින් පැවතියද විමර්ශන කටයුතු කාර්යක්ෂමව සිදු වී නොමැති බව නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලිපිගොනු 453 ක වැඩ නිමකර නොතිබුණි.

## 2.2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ලබා ගැනීම

----------------------------------------------------------------

### 2.2.1 ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ඉටුකර ගැනීම සඳහා රු. මිලියන 42.1 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් රු. මිලියන 41.667 ක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය සම්බන්ධයෙන් පිළියෙල කළ යුතු ප්‍රසම්පාදන සැලසුම් පිළිබඳ නිරීක්ෂණ පහත දැක් වේ.

(අ) **ප්‍රසම්පාදන සැලසුම් කිරීම් හා ප්‍රාරම්භක අවධිය**

---------------------------------------------------

ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කිරීමටත්, ඊළඟ වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කිරීමටත්, මාස 06 කට වැඩි නොවන කාලයක් තුළ නිතිපතා මෙම ලේඛන යාවත්කාලීන කිරීමටත් කටයුතු කර නොතිබුණි.

(ආ) **පූර්ව කොන්ත්‍රාත් අවධිය**

----------------------------

මෙම අදියර යටතේ පිළියෙල කළ යුතු එකිනෙක කොන්ත්‍රාත් ගොනු (Package), ප්‍රසම්පාදන ක්‍රියාවන්හි එක් එක් පියවර ක්‍රමානුකූලව විස්තර වන ආකාරයට ප්‍රසම්පාදන කාල සටහන් සහ උපදේශන සේවා සඳහා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 2.2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

--------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා ඒ හා සබැදි 2017 මාර්තු 15 දිනැති ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 33 හි 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ජාතික තරඟකාරී ලංසු කැඳවීම අනුගමනය කළ යුතු රු. මිලියන 11.31 ක් වටිනා ඩෙක්ස්ටොප් පරිගණක 114 ක්, මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කර ප්‍රසම්පාදනයන් 02 ක් යටතේ මිලදී ගෙන තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 මාර්ගෝපදේශය ප්‍රකාරව සියළුම ආශ්‍රිත වියදම් ඇතුළත් කර මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවද සියළු මිලදීගැනීම් හා ඉදිකිරීම්වලදී එසේ කටයුතු කර නොතිබුණි.

(ඇ) වාර්ෂික අවශ්‍යතාවය හඳුනාගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර මිලදී ගැනීමට කටයුතු නොකර අවස්ථා 06 කදී රු. මිලියන 1.00 ක් වටිනා ටයර් 31 ක් රාජ්‍ය වාණිජ විවිධ

නීතිගත සංස්ථාවෙන් මිලදී ගෙන තිබුණි. එසේම මිලදී ගැනීම් සම්බන්ධයෙන් සැපයුම්කරුවන් සමඟ ඇතිකරගත් ගිවිසුමෙහි ටයර් ලබාදිය යුතු නිශ්චිත කාලය පිළිබඳව හා ප්‍රමාද ගාස්තු පිළිබඳව කොන්දේසි ඇතුළත්ව නොතිබුණි. මේ හේතුවෙන් අවස්ථා 03 ක දී පෞද්ගලික සැපයුම්කරුවන් දෙදෙනෙකුගෙන් ටයර් 31 ක් මිලදී ගැනීමේදී දින 14 ක සිට දින 38 ක් දක්වා ටයර් සැපයීමේදී සිදු වූ ප්‍රමාදයන්ට අදාළ ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) දෙපාර්තමේන්තුව පිහිටුවා වසර 4 කට අධික කාලයක් ගත වී තිබුණ ද දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ වූ අධිකාරි තුනට හා උඩරට ගැමි පුනරුත්තාපන දෙපාර්තමේන්තුවට අයත්ව තිබූ ඉඩම් හා ගොඩනැගිලි දේපල සියල්ල නිශ්චිත වශයෙන් හඳුනාගෙන විධිමත් ආකාරයට පවරා ගෙන නොතිබුණි.

(ආ) දිවයිනේ ප්‍රජාමූල බැංකු 1,074 ක් හා බැංකු සමිති 331 ක් පිහිටි ඉඩම් හා ගොඩනැගිලි, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියට, රජයේ වෙනත් ආයතනවලට, බැංකු හා බැංකු සමිතිවලට වශයෙන් කාණ්ඩ කිහිපයක් යටතේ පවතින දේපලවල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය විසින් බදු දී තිබූ දේපල දෙපාර්තමේන්තුවට පවරා ගෙන සුදුසු ක්‍රියාමාර්ගවලට එළැඹීමට කටයුතු කර නොතිබූ අතර පැරණි බදු ගිවිසුම් යටතේ තව දුරටත් ක්‍රියාත්මක වෙමින් තිබුණි. ඒ අතරින් බුත්තල කාර්මික ජනපදයේ පෞද්ගලික ආයතනයට වර්ෂයකට රු. 25,760 ක් බැගින් බදු දී තිබූ ඉඩමෙන් ද, අබලන් තත්ත්වයෙන් 2013 වර්ෂයේ සිට වසාදමා පවතින ගොඩනැගිල්ලක රු. 289,826 ක හිඟ බදු ආදායම ද අයකර ගැනීමට නොහැකි වී නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය විසින් මධ්‍යම පළාත් මගී ප්‍රවාහන අධිකාරිය සතු ඉඩමක රු. මිලියන 14.92 ක වියදමින් ඉදිකර ඇති කඩකාමර 17 ක් හා වැසිකිළි පද්ධති 02 ක් සහිත කඩුගන්නාව වෙළඳ සංකීර්ණය පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල පැවරීම හෝ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අදාළ කටයුතු සිදුකර නොතිබුණි.

(ඉ) ඇස්තමේන්තුගත වටිනාකම රු.2,650,000 කට වෙන්දේසි කිරීමට ප්‍රසිද්ධ කර, රු. 7,513,499 කට ලංසු ලැබූ වාහන 06 ක් පසුව ගර්හිත කිරීමට තීරණය කර තිබුණි. එයින් වාහන 02 ක් රු. 820,500 කට ගර්හිත වාහන ලෙස අලෙවි කර තිබූ අතර ඉතිරි වාහන 04 සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඊ) **වාහන උපයෝජනය**

දෙපාර්තමේන්තුව සතුව සමාලෝචිත වර්ෂය අවසන්වන විට වාහන 140 ක් පැවති අතර, ඉන් ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කර තිබූ වාහන 53 න් 17 ක් හා දිස්ත්‍රික් කාර්යාලවලට අනුයුක්ත කර තිබූ වාහන 87 ක් වශයෙන් එකතුව වාහන 104 ක ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබූ බැවින් වර්ෂය තුළ ධාවනය කරන ලද දුර ප්‍රමාණය ගණනය කිරීමට නොහැකි විය. සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ඉන්ධන හා ලිහිසි තෙල් වියදම රු. මිලියන 25.11 ක් ද, වාහන අළුත්වැඩියා, වාහන සේවා කිරීම හා වාහන රක්ෂණය

කිරීම ඇතුළත් වාහන නඩත්තු වියදම රු. මිලියන 38.18 ක් ද, වශයෙන් එකතුව රු. 63.29 ක් වැය කර තිබුණි.

(උ) **මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන උපයෝජනය**

---

දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ 2017 අප්‍රේල් සිට වසර 05 ක කාලය සඳහා ලබාගත් ජීප් රථය සඳහා මාසයකට රු. 227,700 බැගින් සමාලෝචිත වර්ෂයේ මාස 09 ක් සඳහා කල්බදු වාරික වශයෙන් රු. 2,049,300 ක් ද, ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු. 112,801 ක් ද, අළුත්වැඩියා වියදම රු. 30,090 ක් ද වශයෙන් රියදුරු වැටුප් හා දීමනා හැර මුළු වියදම රු. 2,192,191 ක් වී තිබුණි. 2016 මාර්තු 17 දිනැති අංක 01/2016 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව මෙම වාහනයේ තොරතුරු හා මාසික ධාවන විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඌ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2 ඡේදය ප්‍රකාරව 2018 ජුනි 15 දිනට ප්‍රථම භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාවලිය අවසන් කර එම වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ප්‍රාදේශීය කාර්යාල 23 ක භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2018 අගෝස්තු 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2015 හා 2016 වර්ෂයන්හි භාණ්ඩ සමීක්ෂණ මඟින් අපහරණය කළයුතු බවට හඳුනාගන්නා ලද පුහුණු මධ්‍යස්ථාන 03 කට හා සංචාරක නිවාස 02 කට අයත් භාණ්ඩ ඒකක 118 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

---

දෙපාර්තමේන්තුව සතු රු. මිලියන 32.8 ක් වටිනා වාහන 05 ක් රේගුව අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. එම වාහන සඳහා ඉන්ධන, අළුත්වැඩියා වියදම් සහ රියදුරු දීමනා හා අතිකාල දීමනා වශයෙන් ඉකුත් වර්ෂයේදී රු.මිලියන 1.67 ක් හා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 1.36 ක් වශයෙන් එකතුව රු. මිලියන 3.03 ක් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි.

**2.4** බැදීම් හා බැරකම්

---

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළැඹීම**

---

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 (අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 14 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 7,783.56 ක ප්‍රතිපාදනය රු. මිලියන 2,952.92 කින් ඉක්මවා රු. මිලියන 3,005.14 ක බැදීම් ඇතිකර ගෙන තිබුණි.

(ආ) **බැරකම් වැඩියෙන් සටහන් කිරීම**

---

සමාලෝචිත වර්ෂය අවසානයට වන්දි හා පාරිතෝෂික බැරකම රු. මිලියන 3,276.49 ක් වුවද, එය රු.මිලියන 3,423 ක් වශයෙන් රු.මිලියන146.51 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) **අයවැය ප්‍රතිපාදන රහිතව බැරකම් එළැඹෙන වර්ෂයට ගෙනයාම**

'ඉසුරුමත් නිවහනක්' වැඩසටහන වෙනුවෙන් 2014 වර්ෂයේ දී ප්‍රජාමූල බැංකු අංශයේ අරමුදලින් ගෙවීම් කළ රු. මිලියන 2,992.78 ක් බැරකම් වශයෙන් දක්වා තිබුණි. නමුත් ප්‍රජා මූල බැංකු අංශය විසින් අයවිය යුතු ණය මුදල රු. මිලියන 3,417.42 ක් වශයෙන් වාර්තා කිරීම හේතුවෙන් රු. මිලියන 424.64 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද සමාලෝචිත වර්ෂයේදී සමෘද්ධිලාභීන්ගෙන් රු. මිලියන 2,055.09 ක් ආපසු අයකරගෙන තිබු නමුත් ණය පියවීමට කටයුතු නොකර එම මුදල් ප්‍රජාමූල බැංකු තුළ රඳවා ගෙන තිබුණි.

(ඇ) **බැරකම් සඳහා ප්‍රතිපාදන ඇතිකර නොගැනීම**

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයක් යටතේ ගෙවිය යුතුව තිබු රු. 382,500ක බැරකම් සඳහා ප්‍රතිපාදන ඇතිකර ගෙන නොතිබුණි.

## 2.5 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් එළැඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථාවක් පහත දැක් වේ.

2013 අංක 01 දරන දිවි නැගුම සංවර්ධන පනතේ 7.1 වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට සහය වීම සඳහා ස්ථාපිත කර ඇති දිවි නැගුම ජාතික සභාවට පත්කළ සාමාජිකයින්ට හා එහි ලේකම්වරයාට දීමනා ගෙවීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දී නොතිබුණි. එසේ වුවද, එම සභාවේ සාමාජිකයින් 11 දෙනෙකුට 2014 වර්ෂයේ ජුලි සිට 2017 වර්ෂයේ ජනවාරි දක්වා සභාවාර 24 කට සහභාගි වීම වෙනුවෙන් එක් සභාවාරයකට රු. 4,000 ක් බැගින් එකතුව රු. 816,000 ක් ද, 2017 වර්ෂයේ පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා සභාවාර 11 කට සහභාගී වීම වෙනුවෙන් එක් සභාවාරයකට රු. 6,000 ක් බැගින් එකතුව රු.624,000 ක් ද, සභා ලේකම්වරයාට 2017 වර්ෂයේ සභා වාර 10 ක් සඳහා එක් සභාවාරයකට රු. 5,000 බැගින් රු. 50,000 ක් ද දීමනා වශයෙන් ගෙවා තිබුණි.

## 2.6 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳව නිරීක්ෂණ පහත දැක් වේ.

(අ) 2011 වර්ෂයේදී අනතුරටපත් ලොරි රථයට සිදු වී තිබු රු. 668,325 ක අලාභය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව හා පරිපූරක වාර්තාව ඉදිරිපත් කර තිබුණද එම අලාභය නිරවුල් කර නොතිබුණි.

(ආ) දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ වූ අධිකාරි තුනෙහි නිලධාරීන් 23,980 දෙනෙකු සඳහා පාරිතෝෂික මුදල් ගෙවීමට භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාදවීම හේතුවෙන් පනත ප්‍රකාරව ගෙවිය යුතු අධිභාරය රු. මිලියන 1,636.45 කින් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු. මිලියන 653.51 ක් ගෙවා තිබුණි.

## 2.7 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වාදුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| | විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|---|
| | වර්ෂය | ඡේද අංකය | |
| (අ) | 2015<br>2016 | 3.1 (ඊ)<br>3.1 (ii) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි. |
| (ආ) | 2015<br><br>2016 | 3.1 (ආ) හා<br>3.10.1 (ආ) (iii)<br>3.18 (ආ) | මුදල් රෙගුලාසි 880 හා 891 (1) ප්‍රකාරව රජයේ නිලධාරීන්ගෙන් ඇප තැන්පතු ලබාගෙන ඇප ලේඛනය පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2015<br>2016 | 1.1 (ඇ)<br>3.18(ඇ) | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය පවත්වා නොතිබුණි. |
| (ඈ) | 2015<br>2016 | 3.10.1 (අ)<br>3.18 (උ) | 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ 36 හා 37 වගන්ති ප්‍රකාරව දිවි නැගුම සංවර්ධන අරමුදල හා දිවි නැගුම චක්‍රීය අරමුදල පිහිටුවා නොතිබුණි. |
| (ඉ) | 2015<br>2016 | 3.10.1 (ආ) (ii)<br>3.18 (ඌ) | මුදල් රෙගුලාසි 763 ප්‍රකාරව ප්‍රධාන කාර්යාලයේ ගබඩා භාණ්ඩ සහ ලිපි ද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ තොග සම්බන්ධයෙන් ගබඩා ව්‍යවස්ථා සම්පාදනය කරගෙන නොතිබුණි. |
| (ඊ) | 2015<br><br>2016 | 3.10.1(ඈ)(i) හා<br>(ii)<br>3.18 (එ) | 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92 (1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව නිලධාරීන්ට වෙන්කළ වාහන හැර අනිකුත් වාහනවල රාජ්‍ය ලාංඡනය සහ දෙපාර්තමේන්තුවේ නාමය යෙදීමටත් චක්‍රලේඛ විධිවිධාන පරිදි වාහනවල ඉන්ධන දහනය වීම නියමිත පරිදි පරීක්ෂා කිරීමටත් කටයුතු කර නොතිබුණි. |
| (උ) | 2015<br>2016 | 3.7 (ආ)<br>3.7 (ඇ) | ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව තිබූ ණය චක්‍රීය අරමුදලට ලැබිය යුතු රු. මිලියන 130.16 ක ණය ශේෂය අයකරගත් බවට තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඌ) | 2015<br>2016 | 3.6 (ආ)<br>3.5 (ඇ) | 2013 වර්ෂයේ සමෘද්ධි සහනාධාර ගෙවීම සදහා ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශයෙන් ලබාගත් රු. මිලියන 3,457.5 කින් තවදුරටත් පියවිය යුතු රු. 2,374.5 ක් පියවීම සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන වෙන්කර නොගෙන පොදු තැන්පත් ගිණුමට ඇතුළත් කර තිබුණි. |
| (එ) | 2016 | 3.16 (අ) | අධිකරණයේ නඩු පවරා ඇති මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 – 2016 කාලය තුළ සිදු වූ රු. 23,406,848 ක මුදල් වංචාව ඇතුළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක 2015 හා 2016 වර්ෂයන්හි සිදු වී ඇති බවට අනාවරණය කරගෙන තිබු |

| | | | |
|---|---|---|---|
| | | | රු. 24,888,966 ක මුදල් වංචාවන්හි පරීක්ෂණ කටයුතු අවසන් කර අලාභයන් අයකර ගෙන නොතිබුණි. |
| (ඒ) | 2016 | 3.14 (ආ) | 2016 වර්ෂයේ මුදල් ප්‍රතිපාදනය කර නොගත් නමුත් ආයෝජන වැය විෂයයට වැය බරක් කරමින් අංකෙලිපිටිය ජල යෝජනා ක්‍රමය පුළුල් කිරීම සඳහා 2016 අගෝස්තු 16 දින මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් වෙත ලබාදුන් රු. මිලියන 32.5 ක මුදලින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අදාළ කාර්යය නිම වී නොතිබුණි. |
| (ඔ) | 2016 | 3.17 (අ) | පෙර වර්ෂයේදී රාජකාරි නොවන ගමන්වලදී සිදු වූ වාහන අනතුරු 2 ක් හා සමාලෝචිත වර්ෂයේ සිදු වූ වාහන අනතුරක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ පවත්වා වගකිවයුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඕ) | 2016 | 3.9 (අ) (ii) | දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ වූ අධිකාරි තුනෙහි මූල්‍ය ප්‍රකාශන අනුව අයවිය යුතුව පැවති රු. 289,664,277 ක් 2017 දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ක) | 2016 | 3.11 (අ) (ii) | දෙපාර්තමේන්තුව තුළ පවත්වාගෙන යනු ලබන සමාජ ආරක්ෂණ අරමුදල, නිවාස සංවර්ධන අරමුදල, බැංකු සංගම් ලිපි ද්‍රව්‍ය චක්‍රීය අරමුදල, සේවක ණය චක්‍රීය අරමුදල, දිවි නැගුම අරමුදල, දිවි නැගුම සමාජ ආරක්ෂණ අරමුදල යන අරමුදල් සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබාගෙන ඒවා ව්‍යවස්ථාපිත කිරීමටත්, වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමටත් කටයුතු කර නොතිබුණි. |

**2.8 කළමනාකරණ දුර්වලතා**

**---------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු. මිලියන 107.53ක වියදමකින් පවත්වන ලද අඩු ආදායම්ලාභින් නැවත හඳුනාගැනීමේ සමීක්ෂණය මගින් සමීක්ෂණ පත්‍රිකා 2,224,432 ක් දත්ත පද්ධතියට ඇතුළත් කොට සමීක්ෂණ ප්‍රතිඵල ලබාගෙන තිබූ නමුත් සහනාධාරලාභී නාම ලේඛන සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමෘද්ධි ප්‍රතිලාභීන්ට හා අඩු ආදායම්ලාභීන්ට ජීවනෝපාය මාර්ග වර්ධනය කර ගැනීම සඳහා චක්‍රීය ආකාරයට ණය ලබාදීම පිණිස සමෘද්ධි ප්‍රජාමූල බැංකු තුළ ක්‍රියාත්මක කරන ලද ජීවනෝපාය චක්‍රීය ණය අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත්කිරීමට කටයුතු කර නොතිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට මෙම අරමුදල් ගිණුමේ ශේෂය රු. මිලියන 3,242.06 ක් ද, තවදුරටත් ණය ලබාදිය හැකි මුදල රු. මිලියන 1,445.76 ක් ද බවට වාර්තා කර තිබුණි.

(ඇ) 1996 වර්ෂයේදී දුම්වැටි හා මත්විරෝධී දිනට සමගාමීව කොඩි අලෙවි ආදායමෙන් ආරම්භ කරන ලද දිවි නැගුම සමාජ සංවර්ධන පදනම, භාණ්ඩාගාරයේ උපදෙස් ලබා ගෙන ව්‍යවස්ථාපිත කර ගිණුම් පොත්පත් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබූ අතර එම පදනමේ අරමුණ වූ සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ හා අඩු ආදායම්ලාභීන්ගේ සමාජ සුභසාධනය වෙනුවෙන් නොයොදවා සමාලෝචිත

වර්ෂයේ ඉපැයූ රු. 185,561,454 ක ආදායම සමඟ 2017 දෙසැම්බර් 31 දිනට රු. 264,171,603 ක මුදලක් රඳවාගෙන තිබුණි.

(ඈ) ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති 20 ක සමෘද්ධි අධිකාරි සමයේ සිදු වී තිබූ බවට අනාවරණය කරගෙන තිබූ මුල්‍ය වංචාවන්හි වටිනාකම රු. 9,923,380 ක් ද, දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් අනතුරුව 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති 45 ක සිදුකර ඇති බවට අනාවරණය කරගෙන තිබූ රු. 79,361,724 ක වංචාවන්ගෙන් රු. 60,284,808 ක මුදලක් සම්බන්ධයෙන් ද පරීක්ෂණ කටයුතු අවසන් කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවත්, බැංකු සමිතියක සිදුකර තිබූ මූල්‍ය වංචාවෙහි වටිනාකම ගණනය කර නොතිබුණි.

## 2.9 මහජනයා වෙත සේවා ඉටුකිරීම

දෙපාර්තමේන්තුව විසින් 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රකාරව මහජනයාට තොරතුරු දැනගැනීම සඳහා විධිමත් ආකාරයට නිලධාරියකු පත්කර නොතිබුණි. එසේම එම පනතේ 26(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට තොරතුරු, නිලධාරියාගේ විස්තර හා සම්බන්ධවීමේ විස්තර යනාදිය ඇතුළත් කිරීමට ද, එම තොරතුරු කාර්යාල පරිශ්‍රයන්හි ප්‍රසිද්ධ කිරීමට ද, ක්‍රමවත් ලේඛන හා ලිපිගොනු නඩත්තු කිරීමටද කටයුතු කර නොතිබුණි.

## 2.10 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2013 අංක 1 දරන දිවි නැගුම පනත මඟින් 2014 ජනවාරි මාසයේ සිට ආරම්භ කළ දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේ කටයුතු ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ වෙන්කර තිබූ ප්‍රතිපාදන මඟින් සිදු කර තිබුණ අතර 2015 සිට 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 3 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2015 | පුනරාවර්තන | 53,439.90 | 51,306.09 | 2,133.81 | 3.99 |
| | මූලධන | 1,319.95 | 1,024.00 | 295.95 | 22.42 |
| | **එකතුව** | **54,759.85** | **52,330.09** | **2,429.76** | **4.44** |
| 2016 | පුනරාවර්තන | 57,010.32 | 53,463.06 | 3,547.26 | 6.22 |
| | මූලධන | 1,247.60 | 1,183.36 | 64.24 | 5.15 |
| | **එකතුව** | **58,257.92** | **54,646.42** | **3,611.50** | **6.20** |
| 2017 | පුනරාවර්තන | 56,777.05 | 2,685.88 | 4,091.17 | 7.21 |
| | මූලධන | 1,236.70 | 1,179.34 | 57.36 | 4.64 |
| | **එකතුව** | **58,013.75** | **53,865.22** | **4,148.53** | **7.15** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු. මිලියන 1.00 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම කිසිදු උපයෝජනයක් නොකර ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 10 ක් සඳහා එකතුව රු. මිලියන 5.758 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනයෙන් එකතුව රු.මිලියන 16.147 ක් පමණක් උපයෝජනය කර තිබූ අතර, ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ක් සිට සියයට 87 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වැය නොවූ සහනාධාර රු. මිලියන 9.985 ක් වැය විෂයයට අධිභාර නොකිරීම හා මාසික තත්‍ය සහනාධාර වියදම ගණනය නොකර ඇස්තමේන්තුගත උපරිම වාර්තා මත සහනාධාර වියදම ගණනය කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 39,707.051 ක සහනාධාර වියදමෙහි නිවැරදිතාවය සනාථ කරගත නොහැකි විය.

(ඈ) දරිද්‍රතාවය තුරන්කිරීමේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වූ ආයෝජන වැය විෂයය යටතේ සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදිත රු. මිලියන 23.260 ක් ඇතුළුව 2017 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 102.766 ක් ස්ථාවර වත්කම් මිළදී ගැනීම සඳහා යොදවා තිබූ අතර එම වත්කම් විසර්ජන ගිණුමට ඇතුළත් කර නොතිබුණි.

(ඉ) වැය විෂයයන් 20 කට ගිණුම් සාරාංශය මඟින් ගැලපීම් වශයෙන් අධිභාර කර තිබූ රු. මිලියන 89.14 ක් කුමන කාර්යාලයකට අයත් කුමන ආකාරයේ ගැලපීම්ද යන්න හඳුනාගෙන නොතිබුණි.

(ඊ) ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ වටිනාකම රු. මිලියන 221.30 ක් හා යන්ත්‍රෝපකරණ වටිනාකම රු. මිලියන 10.83 ක් වශයෙන් විසර්ජන ගිණුමට ඇතුළත් කර තිබූ නමුත් ඒ සඳහා උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි.

(උ) දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ වූ ආයතනවලට අයිතියක් නොතිබූ වටිනාකම රු. මිලියන 31.50 ක දේපල විසර්ජන ගිණුමට ඇතුළත් කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී වටිනාකම රු. මිලියන 2.2 ක් වූ වාහනයක් දෙවරක් ද, 1999 වර්ෂයේ මිලදීගත් රු. මිලියන 1.82 ක වාහනයක් ද, විසර්ජන ගිණුමට ඇතුළත් වී තිබීමෙන් විසර්ජන ගිණුමේ වාහනවල වටිනාකම රු. මිලියන 4.02 ක් වැඩියෙන් දක්වා තිබුණි.

## 2.11 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂයය අංක 33101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 350.00 | 324.91 | 265.00 | 265.73 | 600.00 | 96.41 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2002 හා 2003 වර්ෂවල ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ රු. 607,109 ක ණය ශේෂ එම ආයතනවලට පවරාදීමට කටයුතු නොකර අත්තිකාරම් බී ගිණුමෙන් ඉවත්කර ගෙවිය යුතු ශේෂයන් ලෙස පොදු තැන්පත් ගිණුමට ඇතුළත් කර තිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරුවී ගිය, මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් වීම හා සේවයෙන් පහකළ නිලධාරීන් 129 දෙනෙකුගෙන් අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 2,020,195 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 03 ක සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 2.12 අග්‍රිම ගිණුම

සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබුණු අග්‍රිම ඇස්තමේන්තුව අනුව මාසයකට ලබා ගැනීමට අපේක්ෂා කළ අග්‍රිමයත්, මාසිකව ඉල්ලුම් කළ අග්‍රිමයත් හා ලැබී තිබුණු අග්‍රිමයන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| | මාසය | සැළසුම් කළ පරිදි ඉල්ලුම් කළ යුතු අග්රිමය | ඉල්ලුම් කළ අග්‍රිමය | ලැබී තිබුණු අග්‍රිමය | සැලසුම් කළ පරිදි ඉල්ලුම් කළ අග්‍රිමය අතර වෙනස (වැඩි) /අඩු | ඉල්ලුම් කළ අග්‍රිමය හා ලැබී තිබුණු අග්‍රිමය අතර වෙනස |
|---|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 01 | ජනවාරි | 4,789.72 | 5,489.42 | 4,387.72 | (699.70) | 1,101.70 |
| 02 | පෙබරවාරි | 4,797.22 | 4,740.29 | 4,229.00 | 56.93 | 511.29 |
| 03 | මාර්තු | 4,790.72 | 5,780.34 | 4,254.50 | (989.62) | 1,525.84 |
| 04 | අප්‍රේල් | 5,051.92 | 5,831.38 | 4,476.51 | (779.46) | 1,354.87 |
| 05 | මැයි | 4,791.72 | 5,427.55 | 4,938.90 | (635.83) | 488.65 |
| 06 | ජූනි | 4,800.72 | 5,363.67 | 4,204.00 | (562.95) | 1,159.67 |
| 07 | ජූලි | 4,801.72 | 5,354.62 | 4,585.08 | (552.90) | 769.54 |
| 08 | අගෝස්තු | 4,795.72 | 5,372.65 | 4,519.00 | (576.93) | 853.65 |
| 09 | සැප්තැම්බර් | 4,806.72 | 5,357.92 | 4,470.84 | (551.20) | 887.08 |
| 10 | ඔක්තෝබර් | 4,805.72 | 5,254.02 | 4,390.89 | (448.30) | 863.13 |
| 11 | නොවැම්බර් | 4,811.72 | 5,293.32 | 4,536.22 | (481.60) | 757.10 |
| 12 | දෙසැම්බර් | 4,821.24 | 4,762.31 | 4,472.45 | 58.93 | 289.86 |
| | | **57,864.86** | **64,027.49** | **53,465.11** | **6,162.63** | **10,562.38** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් තැබීමේ දෝෂයක් බවට දෙපාර්තමේන්තුව හඳුනාගත් රු. 2,950,975 ක ශේෂයක් උපලබ්ධි නොවූ තැන්පතු වශයෙන් 2016 මාර්තු මාසයේ සිට බැංකු සැසඳුමෙන් ඉදිරියට ගෙන එමින් තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩාගාරයට අග්‍රිම පියවීම නිවැරදි නොවුණි.

(ආ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළයුතු වුවත්, නිලධාරීන් 46 දෙනෙකුට අවස්ථා 78 ක දී ලබා දී තිබූ රු. මිලියන 1.61 ක තත්කාර්ය අතුරු අග්‍රිමය කාර්ය නිම වී දින 21 ක සිට මාස 09 ක කාල ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි.

(ඇ) නිලධාරීන්ට අත්තිකාරම් ලබා දිමේදී වියදම් නිසි පරිදි පුරෝකථනය කර නොතිබූ නිසා නිලධාරීන් 15 දෙනෙකු වෙත අවස්ථා 28 ක දී ලබා දී තිබූ එකතුව රු. 1,588,510 ක අත්තිකාරම් මුදලින් එකතුව රු. 649,595 ක ඉතිරිවීම් තිබුණි. එය ලබා දී තිබූ අත්තිකාරම් මුදලින් සියයට 20 ක සිට සියයට 78 ක ප්‍රමාණයක් වී තිබුණි.

## 2.13 පොදු තැන්පත් ගිණුම

---------------------

දෙපාර්තමේන්තුව යටතේ පවතින පොදු තැන්පත් ගිණුම් 05 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 2,494.264 ක් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු. 602,026 ක් වූ තැන්පතු 21 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේදී සමෘද්ධි සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීමේ තරඟ විභාගය පැවැත්වීම සඳහා එකතු කළ ගාස්තුවලින් වියදම් දැරීමෙන් අනතුරුව ඉතිරිවීම් රු. 8,057,544 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ වූ ආයතන 2 ක නිල බැංකු ගිණුම් අහෝසිකර 2016 වර්ෂයේදී එවන ලද රු. 2,673,641 ක්, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියට ලැබිය යුතුව තිබූ මුදල් රු. 23,161,741 ක් හා දෙපාර්තමේන්තුවේ පුහුණු මධ්‍යස්ථාන හා සංචාරක බංගලා මඟින් ඉපැයූ ආදායමෙන් වියදම් ආවරණය කර ගැනීමෙන් පසු ඉතිරි වූ රු. 2,498,738 ක් වශයෙන් එකතුව රු. 28,334,120 ක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඈ) භාණ්ඩාගාරයේ අවසරය ලබා ගැනීමකින් තොරව ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශයේ හා සමාජ ආරක්ෂණ භාර අරමුදලේ රු. මිලියන 502.34 ක් පොදු තැන්පත් ගිණුමට මාරු කර, එයින් රු. මිලියන 477.16 ක ගනුදෙනු සිදුකර ඉතිරි වූ රු. මිලියන 25.18 ක් 2017 දෙසැම්බර් 31 දින ආපසු ගෙවා තිබුණි.

(ඉ) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ක් ඉක්ම වූ චෙක්පත් 108 ක වටිනාකම රු. මිලියන 1.46 ක් නිරවුල් කිරීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඊ) 2012 වර්ෂයට අදාළව නොගෙවූ නිවාස සංවර්ධන ලොතරැයි ත්‍යාග රු. 150,000 ක් නිරවුල් නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**2.14 බැංකු ගිණුම් මෙහෙයවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**ගැළපුම් කළයුතු ශේෂ**

දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු නිල බැකු ගිණුමට හා දිස්ත්‍රික් කාර්යාල 17 කට අදාළව ඉදිරිපත් කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් වී නොතිබුණු එකතුව රු. මිලියන 6.162 ක් වටිනා චෙක්පත් 270 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) බැංකුව විසින් සෘජු ගෙවීම් ලෙස බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි දක්වා තිබුණු එකතුව රු. මිලියන 3.888 ක නිවැරදිතාවය සොයා බලා අවශ්‍ය ගැලපීම් කිරීමට 2018 ජුනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**2.15 විගණන සාක්ෂි ඉදිරිපත් නොකිරීම**

**විගණන විමසුම්වලට පිළිතුරු ලබා දීම**

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 08 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර ප්‍රමාද කාලය මාස 01 ක සිට මාස 04 ක් දක්වා කාල පරාසයක් වී තිබුණි. එම විමසුම්වලට අදාළව ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.මිලියන 2,166.13ක් විය.

**2.16 අනුකූල නොවීම**

**බදු අවශ්‍යතාවලට අනුකූල නොවීම**

2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් දිවි නැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල කළමනාකරණ මණ්ඩල සාමාජිකයන්ට 2017 අප්‍රේල් දක්වා ගෙවන ලද රු. 1,492,500 ක දීමනා සහ එම කමිටුවේ සභාපතිට හා ලේකම්ට වැටුපෙන් 1/3 ක් වශයෙන් ගෙවන ලද රු. 190,791 ක දීමනා සඳහා ද, දිවි නැගුම ජාතික සභාවේ සමාජිකයන්ට හා ලේකම්ට 2017 ජුනි දක්වා ගෙවන ලද රු. 1,124,000 ක කමිටු දීමනා සඳහා ද සියයට 10 බැගින් ගෙවිය යුතු රු. 280,729 ක උපයන විට ගෙවීම් බදු අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කර නොතිබුණි.

**2.17 මානව සම්පත් කළමනාකරණය**

**2.17.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 11,522.59 ක් වැයකර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 501 | 72 | 429 |
| (ii) | තෘතියික මට්ටම | 1,941 | 1,931 | 10 |
| (iii) | ද්විතියික මට්ටම | 24,231 | 23,484 | 747 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 516 | 510 | 06 |
| | **එකතුව** | **27,189** | **25,997** | **1,192** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමත කාර්ය මණ්ඩලයෙහි දෙපාර්තමේන්තුවේ සේවාවන් දෙකකට හැරුණු විට අධිකාරි තුනෙන් අනුයුක්ත වූ අනුමත කාර්ය මණ්ඩලය 1,049 ක් සඳහා සේවා ව්‍යවස්ථාවක් හා තනතුරුවලට අදාළව බඳවාගැනීමේ පටිපාටි අනුමත කරගෙන නොතිබීමෙන් බඳවා ගැනීම්, උසස් කිරීම් හා විශ්‍රාම ගැන්වීම් ආදී කාර්යයන් සිදු කිරීමටද පත්වීම් ලිපි ලබාදීමට ද නොහැකි වී තිබුණි. ඒ අතර විශ්‍රාම ගිය නිලධාරීන් 62 දෙදෙනෙකු හා මියගිය නිලධාරීන් 144 දෙනෙකු විය.

(ආ) දිවි නැගුම දිස්ත්‍රික් අධ්‍යක්ෂ තනතුරු 20 ක් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් පිරවිය යුතු වුවත්, තනතුරු 11 ක් රාජකාරි ආවරණය කිරීමේ පදනම මත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II හා III ශ්‍රේණිවල හා ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ II හා III ශ්‍රේණිවල නිලධාරීන්ගෙන් ද, තනතුරු 03 ක් ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් වැඩ බැලීමේ පදනමට ද සේවයේ යොදවා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ I ශ්‍රේණියේ දිස්ත්‍රික් ගණකාධිකාරි තනතුරු 16 ක් එම සේවයේ II හා III ශ්‍රේණිවල නිලධාරීන්ගෙන් වැඩ බැලීමේ පදනම මත ආවරණය කර ගෙන තිබූ අතර දිස්ත්‍රික්ක 4 ක් සඳහා ගණකාධිකාරිවරුන් පත්කර නොතිබුණි.